# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2451/25 - 2025 අගෝස්තු මස 27 වැනි බදාදා - 2025.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්ති අනුව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග**

01. තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය සුනිල් කුමාර ගමගේ වන මම සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වගන්ති අනුව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා ලෙස මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත ක්‍රීඩාවන් සඳහා වන ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලනයන් හි ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවන අතර එකී ජාතික ක්‍රීඩා සංගම් / සම්මේලනයන් හි පරිපාලනය හා වෙනත් යම් අවැසි කටයුතු යථායෝග්‍ය අයුරින් ඉටු කිරීම උදෙසා 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ එහි සංශෝධන අනුව සහ ඒ යටතේ නිකුත් කරන ලද විධිවිධාන අනුව **පවතින ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරගැනීම සඳහාත්, නව නිලධාරීන් පත්කර ගැනීම සඳහා වූ නිලවරණ ක්‍රියාවලිය සම්පූර්ණ කරගැනීම සඳහාත් යනාදී සීමිත කාරණා සඳහා** 2025 අගෝස්තු මස 27 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි **තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා** නිසි බලධාරියා ලෙස මෙයින් පත් කරමි.

**01.** සැහැල්ලු පන්දු ක්‍රිකට්
**02.** කබඩි
**03.** එල්ලේ

02. මම මෙයින්, ඉහත ක්‍රීඩාවන් සඳහා වන ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන් හි සංශෝධිත ව්‍යවස්ථාව යටතේ වාර්ෂික මහ සභා රැස්වීමක දී පැවැත්වෙන නිලවරණයකදී සිය නිලධාරීන් තෝරාපත් කරගන්නා තෙක්, ඉහත ක්‍රීඩාවන් සඳහා වන ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන් හි කාර්යයන් කරගෙන යාම සහ කළමනාකරණය කිරීම සඳහා ඉහත කී **තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා** වෙත බලය පවරා දෙමි.

**සුනිල් කුමාර ගමගේ (පා. ම.),**
තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය.

2025 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

EOG 08 - 0299

1A - G 45257 — 05 (2025/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*